# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,084 - 2018 අගෝස්තු මස 10 වැනි සිකුරාදා - 2018.08.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 492 |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 493 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 අගෝස්තු මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අගෝස්තු මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


491-B 081438 — 353 (2018/08)
D 1 -

# පිස්කල් විකිණීම්

## අංක 194/ MB දරන නඩුවට අදාලව මාරවිල දිසා අධිකරණයේ පිස්කල් මගින් කරනු ලබන වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ , මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත්, දකුණු පිටිගල් කෝරළයේ, යටකලන් පත්තුවේ, ඉහල මහවැව නැමැති ගමේ පිහිටි, දන්වල අගාර නැමැති ඉඩමට, ඒ. ඒ. විමලසේන බලයලත් මානක තැන විසින් 2006.10.31 වැනි දින මැන සාදන ලද අංක 3512 ඒ දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය ඃ අක් ඃ 00, රූඩ් ඃ 02, පර් ඃ 23.00

ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමඟ වේ. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 110/149 හි ලියාපදිංචි වී ඇත.

*දේපලට පිවිසීම*.- පුත්තලම A3 ප්‍රධාන මාර්ගය ඔස්සේ මහවැව පන්සල් හංදිය දක්වා ගමන් කර එම හන්දියෙන් (59 වැනි මීටර් කණුව) වමට හැරී පන්සල පාරේ මීටර් 400ක් පමණ ගමන් කරන විට T හන්දියක් හමුවේ. එතැනින් වමට හැරී මීටර් 250ක් පමණ ගොස් නැවත වමට හැරී එම පාරේ යාපා ස්ටෝර්ස් පිහිටා ඇති, වංගුව අසල වම් පැත්තට වන ලෙස අදාල දේපල පිහිටා ඇත.

නි/පිස්කල් විසින් 2018 සැප්තැම්බර් මස 11 වැනි අඟහරුවාදා දින පෙ. ව. 10.30ට දේපල පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ මිල තීන්දු වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් ගෙවිය යුතු ය ඃ-

1. ගැණුම් මිලෙන් 25%ක් (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක්) විකුණුම් බදු,
3. පිස්කල් කොමිස් මුදල, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය ප්‍රකාරව වන කොමිස් මුදල,
4. සියලුම ප්‍රචාරක ගාස්තු,
5. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500.00,
6. වෙන්දේසිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
7. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

අදාල දේපල විකිණීම උසාවිය අනුමැතිය මත සිදුවේ.

ගැණුම් මිලෙන් 75% (සියයට හැත්තෑපහක්) වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ඇතුළත ඉහත අංක දරන නඩුවේ බැරට තැන්පත් කල යුතු වේ.

ඉහත සඳහන් කල පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් මුදලින් තැන්පත් කල මුදල් ආපසු නොගෙවන අතර, දේපළ නැවත වෙන්දේසි කිරීමට ක්‍රියා කරනු ඇත.

අදාල ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂාව සහ වැඩි විස්තර ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, මහජන බැංකු ගොඩනැගිල්ල (පළමු මහල), අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය වෙතින් ලබාගත හැක.

දුරකථන ඃ 032-2253300, 032-2253301, ෆැක්ස් ඃ 032-2255247.

රෙජිස්ට්‍රාර්/නි/පිස්කල්,
දිසා අධිකරණය,
මාරවිල.

08-452

# විවිධ දැන්වීම්

## බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය (සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) (කොළඹ දී පැවැත්වෙන)

නඩු අංකය - HC/Civil/44/2018/CO
ස්වභාවය - සමාගම්
කාර්යපටිපාටිය - ලඝු
වටිනාකම - රු. 214,939,872.70

පෙර නව නගරය, ගොතටුව, කොළොන්නාව, අංක 1 සහ මාළඹේ, රොබට් ගුණවර්ධන මාවත, අංක 398/8 දරන ස්ථානයේ පිහිටි දීපිකා මයික්‍රෝ ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ් පිහිටි (කලින් දීපිකා බෑග්ස් ඇන්ඩ් කලෙක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්) යන සමාගම පිළිබඳ කාරණයේ දී ය.

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් ඈවර කිරීම සඳහා වූ කරනු ලබන ඉල්ලීම පිළිබඳ කාරණයේ දී ය.

එල්. ඕ. එල්. සී. ෆැක්ටර්ස් ලිමිටඩ්,
ලියාපදිංචි කාර්යාලය,
100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

**ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය :**

අංක 504, නාවල පාර,
රාජගිරිය.

..................................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් සමාගම වාණිජ මහාධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා පෙත්සමක් රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 100/1 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සහ රාජගිරිය, නාවල පාර, අංක 504 හි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටි එල්. ඕ. එල්. සී. ෆැක්ටර්ස් ලිමිටඩ් විසින් වර්ෂ 2018 ක් වූ ජූනි මස 26 වැනි දින වාණිජ මහා අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, එම පෙත්සම වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර් මස 04 වැනි දින අධිකරණය ඉදිරියේ විභාග කිරීමට විධාන කෙරුණු බවත්, එම පෙත්සමට අදාළව නියෝගයක් කිරීමට පක්ෂව හෝ විරුද්ධව කරුණු සැළ කර සිටීමට අපේක්ෂා කරන එකී සමාගමේ ණය හිමියන් හෝ සහදායකයෙක් වේ නම් ඒ සඳහා තමාම හෝ සිය නීති උපදේශකවරයා හෝ නීතිඥවරයා මගින් එම විභාගය පවත්වන අවස්ථාවේදී පෙනී සිටිය හැකි බවත්, එකී පෙත්සමේ පිටපතක් ලබා ගැනීම සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට එහි පිටපතක් අවශ්‍ය කරන එකී සමාගමේ යම් ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට පහත අත්සන් කරන අය විසින් සපයනු ලබන බවත් මෙයින් දැනුම්දෙනු ලැබේ.

*අත්සන් කළේ :* පූර්ණිමා ඥාණසේකර,
අංක 17, තෙවන මහළ
බෙල්මන්ට් විදීය,
කොළඹ 12.

*සටහන :* එකී පෙත්සම විභාග කරන අවස්ථාවේදී පෙනී සිටීමට අදහස් කරන කිසිවෙකු වෙතොත් එසේ කිරීමට තමා අදහස් කරන බවට ලිඛිත නිවේදනයක් ඉහත නම් සඳහන් පූර්ණිමා ඥාණසේකර වෙත ගෙනවිත් භාරදිය යුතු හෝ තැපෑලෙන් එවිය යුතු වේ. එම නිවේදනයේ එම අයගේ නම හා ලිපිනයට හෝ ව්‍යාපාරික ආයතනයක් නම්, එම ව්‍යාපාරික අයතනයේ නම හා ලිපිනයද සඳහන් කොට එම අය විසින් හෝ එම ව්‍යාපාරික ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ හෝ නීතිඥවරයෙකු වෙතොත් ඔහු විසින් අත්සන් කොට ඉහත නම් සඳහන් අය වෙත වර්ෂ 2018 ඔක්තෝබර් මස 03 වැනි දින පස්වරු 6.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ගෙනවිත් භාර දිය යුතු ය. නැතහොත් එපරිදි තැපෑලෙන් එවිය යුතු ය.

පූර්ණිමා ඥාණසේකර,
අංක 17, තෙවන මහළ,
බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.

08-385

**ළමා සංවර්ධන ලංකා ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

කවීන්ද්‍රන් කෝඩීෂ්වරන් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 52 දරන නියෝග යටතේ 'ළමා සංවර්ධන ලංකා ආයතනය' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ළමා සංවර්ධන ලංකා ආයතනය සංස්ථාගත කිරීමයි.

*(අ)* දරුවන්ගේ සෞඛ්‍ය, පුනරුත්ථාපනය, සත්කාරක සේවාවන් වැඩිදියුණු කිරීම සහ එවැනි සේවාවන්හි අවශ්‍යතාවය ඇති රෝගී සහ ආබාධිත දරුවන් සඳහා නිවසට පැමිණ ලබාදෙන සේවා භාර ගැනීම.

*(ආ)* දිවා සුරැකුම් මධ්‍යස්ථාන, සෞඛ්‍ය මධ්‍යස්ථාන, ළමා සුරැකුම් මධ්‍යස්ථාන, නේවාසිකාගාර, ළමා නිවාස පිහිටුවීම, පවත්වාගෙන යෑම සහ ළමා සංවර්ධන පිළිබඳ ක්‍රියාකාරකම් සඳහා යොම වීම; යනාදිය වෙයි.

කවීන්ද්‍රන් කෝඩීෂ්වරන්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
දිගාමඩුල්ල දිස්ත්‍රික්කය.

08-363

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.